ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනයේ (IFJ)

# මාධ්‍ය වෘත්තිකයන්

සඳහා

# කොවිඩ්-19
# ආරක්ෂක උපදෙස් මාලාව

FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

කොරෝනා වයිරස් රෝගය හෙවත් කොවිඩ්-19 වසංගත තත්වය හමුවේ ලෝකය අර්බුදයට පත් වී සිටියදී ජනමාධ්‍යවේදීන්ට ද තම සේවා ස්ථානයේදී, ගමන් බිමන් යන විට සහ ලොව පුරා වාර්තාකරණයන් සිදු කරන විට එහි බලපෑම ඇති විය හැකි ය. ඔවුන්ගේ සහ ඔවුන් ගනුදෙනු කරන මහජනතාවගේ සෞඛ්‍යය සෑම අවස්ථාවකදී ම ඉහළ ම ප්‍රමුඛතාව විය යුතු ය.

වර්තමාන අර්බුදය විසින් කම්කරුවන්ට ඇති කරන බලපෑම සම්බන්ධයෙන් වෘත්තීය සමිති සේවායෝජකයන් සහ රජය සමග කටයුතු කරමින් සිටිති.  එමගින් තම දේශීය සමිති හරහා තම සාමාජිකයන්ට සහාය සහ උපදෙස් සපයමින් සිටිති.

ජනමාධ්‍යවේදීන් නියෝජනය කරන ලොව විශාලතම වෘත්තීය සංගමය වන ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය (IFJ) ලොව පුරා රටවල් 146ක සාමාජිකයන් 600,000ක් නියෝජනය කරයි. ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය විසින් මෙම මාධ්‍ය උපදෙස් මාලාව නිකුත් කරනු ලබන්නේ සෞඛ්‍ය විශේෂඥයන්ගේ නිර්දේශානුකූලව පූර්ව ආරක්ෂණයන් අනුගමනය කිරීම සඳහා ජනමාධ්‍යවේදීන් යොමු කරමිනි.

# 1. සේවා ස්ථානයේ සෞඛ්‍යය




- ජනමාධ්‍ය සේවායෝජකයන් කොරෝනා වයිරස වසංගත තත්වය සෞඛ්‍ය සහ ආරක්ෂණ අර්බුදයක් ලෙස සැලකිය යුතු අතර තමන්ගේ කාර්ය මණ්ඩලයට සැලකීමේ වගකීම සපිරිය යුතු ය.




- ජනමාධ්‍යවේදීන් සහ වෙනත් මාධ්‍ය වෘත්තිකයන් මෙන් ම ඔවුන්ගේ සංවිධාන ද යාවත්කාලීන වී සිටිය යුතු ය. ඒවා විසින් තමන් සහ අනෙක් අය කොරෝනා වයිරස් රෝගයෙන් ආරක්ෂා කරගැනීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ සහ උපදෙස් අනුගමනය කළ යුතු ය. එම විස්තර මෙම ලිපිනයෙන් ලබාගත හැකි ය.

  https://www.who.int/emergencies/diseases/novel-coronavirus-2019/advice-for-public



- කාර්යාලයේදී වයිරසය ආසාදනය වීමේ අවදානම අවම කරගැනීම සඳහා නිවසේ සිට වැඩ කිරීමේ අවස්ථාව සේවකයන්ට ලබා දීම ගැන බැරෑරුම්ව සලකා බැලිය යුතු ය.



- ජනමාධ්‍යවේදීන් සහ වෙනත් මාධ්‍ය වෘත්තිකයන් විසින් සෞඛ්‍ය සම්පන්න සේවා තත්වයන් සඳහා ඇති අයිතිය ඉල්ලා සිටිය යුතු ය. කොරෝනා වයිරසය ආසාදනය වීමේ තර්ජනයක් ඇති විටදී සේවා ස්ථානයට වැඩ සඳහා නොපැමිණිය යුතු ය.






- කාර්යාල අවකාශය සහ උපකරණ නිරතුරුව පිරිසිදු කළ යුතු ය. විශේෂයෙන් ම කාර්ය මණ්ඩල විසින් හවුලේ පාවිච්චි කරන ඒවා ගැන සැලකිලිමත් විය යුතු ය.

# 2. ගමන් බිමන් සැලසුම්



- මෙම අර්බුද සමයේදී ගමන් බිමන් යාම මාධ්‍ය වෘත්තිකයන්ට, ඔවුන්ගේ පවුල්වලට සහ සේවායෝජකයන්ට ගැටලුවක් විය හැකි ය. එබැවින්, ගමන් බිමන් යාමේ සහ වෛද්‍ය උපදෙස් ලබාගැනීමේ අවශ්‍යතාවන් පිළිබඳ අවංක සාකච්ඡාවක් තිබිය යුතු ය. එහිදී ගමන යන අයගේ ශාරීරික යෝග්‍යතාව සහ ඔවුන්ගේ සෞඛ්‍ය තත්වය මත පදනම්ව තීරණ ගත යුතු ය.



- තම සෞඛ්‍යයට සහ ජීවිතයට කොරෝනා වයිරසය විසින් තර්ජනයක් ඇති විට, කොරෝනා වයිරසය සම්බන්ධ ඕනෑම ජාතික හෝ ජාත්‍යන්තර වාර්තා කිරීමේ පැවරුමක්, සිය රැකියාවට අවදානමක් නොමැතිව ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මාධ්‍ය වෘත්තිකයන්ට තිබේ.




- ගමන් යා යුතු වන ජනමාධ්‍යවේදීන් සහ වෙනත් මාධ්‍ය සේවකයන් එම ගමන් පරිස්සමෙන් සැලසුම් කරගත යුතු ය. බොහෝ රටවල ක්‍රියාත්මක දේශ සීමා වැසීම්, විදේශිකයන්ට ඇතුළු වීම තහනම් කිරීම්, සියලු මගීන් නිරෝධායනයට ලක්කිරීම් වැනි විවිධ ගමන් බිමන් සම්බාධක පිළිබඳ සැලකිලිමත් වන්න.




- යාමට නියමිත රට හා සම්බන්ධ මහජන රැස්වීම තහනම් කිරීම වැනි වැඩිදුර විස්තර සොයාගන්න.



- ගමන් බිමන් යන ජනමාධ්‍යවේදීන් ගොඩබසින අවස්ථාවලදී කොරෝනා වයිරසය සඳහා පරීක්ෂා කිරීම, වෙනත් අවශ්‍ය එන්නත් සම්බන්ධ විමසීම් ආදිය බලාපොරොත්තු වන්න. ඒවා පිටත් වීමට පෙර සිදු කර ලේඛන ළඟ තබා ගත යුතු ය.





- ගමන් සඳහා රක්ෂණයක් ලබාගන්නා ලෙස දැඩිව අවවාද කරනු ලැබේ. විශේෂයෙන් ම වඩාත් බලපෑම් සහිත රටවලට සහ කලාපවලට යන්නේ නම් එය අත්‍යවශ්‍ය ය. නම්‍යශීලී ගුවන් ගමන් සැලැස්මක් තහවුරු කරගන්න.




- මාධ්‍ය වෘත්තිකයන් ගුවන් සේවා සමග සමීප සම්බන්ධයක් පවත්වාගත යුතු ය. ගුවන් ගමන් වෙන් කරගැනීම් හා කාලසටහනේ වෙනස්කම්, අවලංගු කිරීම් ආදිය පිළිබඳ පරීක්ෂාවෙන් ඉන්න.




- වර්තමාන අර්බුදකාරී තත්වය තුළ කොරෝනා වයිරස් රක්ෂණයක් ලබාගැනීම ද නිර්දේශ කරනු ලැබේ.







- අත්වැසුම්, දෑත් පවිත්‍රකාරක වැනි ඇතැම් පෞද්ගලික සනීපාරක්ෂක ද්‍රව්‍ය සේවා කටයුතුවලදී අවශ්‍ය විය හැකි ය. ඒවා ගමන පිටත් වීමට පෙර සපයා ගත යුතු ය. පිවිසෙන රටෙහි ඒවා ලබාගැනීමට නැති විය හැකි ය.

# 3. කොවිඩ්-19 බලපෑම සහිත ප්‍රදේශවල ආරක්ෂිත ලෙස වාර්තා කිරීම



- රෝගයෙන් පෙළෙන පුද්ගලයන් සමග සමීප සම්බන්ධයක් පවත්වන ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය වෘත්තිකයන් හට රෝගය වැළඳීමේ අවදානම වැඩි බවට දැඩි ලෙස අවවාද කරනු ලැබේ. විශේෂයෙන් වාර්තා කිරීම වෙනුවෙන් වෛද්‍ය පහසුකම් වෙත යාමේදී මෙම අවදානම ඇති වේ.




- ඇති කරනු ලබන සතුන් සමීපයට යාමේදී ද මෙම අවදානම ම ඇති වේ. දෑත්, සබන් සහ වතුර භාවිතා කර නිරතුරුව සේදීමෙන් හෝ විකල්පයක් ලෙස දෑත් පවිත්‍ර කරන ද්‍රාවණයක් භාවිතා කිරීම හෝ අත්වැසුම් භාවිතා කිරීම මෙවැනි අවස්ථාවලදී දැඩි ලෙස නිර්දේශ කරනු ලැබේ.






- චිත්‍රාගාර/ ශබ්දාගාර වැඩසටහන්වලදී අවදානම් ප්‍රදේශවල පුද්ගලයන් භෞතිකව පැමිණීම අවම කිරීම සඳහා දුරකථන හෝ වීඩියෝ සම්මුඛ සාකච්ඡා වඩා සුදුසු ය. බාහිර සම්මුඛ සාකච්ඡාවලදී, වයිරසය පැතිරිය නොහැකි පරිදි සමාජ පරතරය පවත්වා ගැනීමට යෝග්‍ය වන සේ ජනමාධ්‍යවේදීන් මයික්‍රෆෝන සඳහා දිගු කේබල භාවිතා කළ යුතු ය.




- ඇතැම් අවස්ථාවලදී, බලධාරීන් විසින් වයිරසය පැතිරීම වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස හෝ ඇතැම් ස්ථානවලින් පැමිණෙන පුද්ගලයන් ඉලක්ක කිරීම හේතුවෙන් හෝ කැළඹීම් ඇතිවීමේ අවදානම ගැන ජනමාධ්‍යවේදීන් පරීක්ෂාකාරී විය යුතු ය.




- කෙටි දැනුම් දීමකින් දේශීය ගමන් බිමන් සීමා කිරීම වැනි මහජන සෞඛ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳව පොදු නිවේදන දැනගැනීම සඳහා ප්‍රාදේශීය ප්‍රවෘත්ති නිරීක්ෂණය කිරීම වැදගත් වේ.




- ජනමාධ්‍යවේදීන්ට ඇතැම් ප්‍රදේශවලට ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීම, මාධ්‍යවේදීභාවය පිළිනොගැනීම, ඉවත් කිරීම මෙන් ම, වීඩියෝ හා ඕඩියෝ දත්ත විනාශ කිරීම වැනි වාර්තා කිරීම මත පනවන වැඩිදුර සම්බාධක තිබිය හැකි ය. ප්‍රායෝගිකව හැකි ඉක්මණින් වීඩියෝ සහ ඕඩියෝ දත්ත ප්‍රවෘත්ති මැදිරි වෙත යවා අමතර පිටපත් තබාගත යුතු ය.



- දේශීය තොරතුරු සහ උපදෙස් සඳහා, කරුණාකර, ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සම්මේලනය සමග අනුබද්ධ අදාළ රටේ සංගම් සහ සංවිධාන සමග සම්බන්ධ වන්න. (https://www.ifj.org/who/members.html)

# 4. නිදහස් මාධ්‍යවේදීන් සඳහා සහාය ලබාදෙන්න




- කොරෝනා වයිරසය හේතුවෙන් ආදායම් අහිමි වූ නිදහස් ජනමාධ්‍යවේදීන්ට උපකාර කිරීම සඳහා ජනමාධ්‍ය සංවිධාන බලපෑම් කළ යුතු ය. පවරන ලද, එහෙත්, අර්බුදය නිසා සම්පූර්ණ කිරීමට බැරි වූ කාර්යයන් සම්බන්ධයෙන් ගෙවීම් සිදු කරන්නැයි ඉල්ලා සිටිය හැකි ය. රටවල් හා ප්‍රදේශ වසාදැමීම සිදු වන කාල වකවානුවලදී අනියම් මාධ්‍යවේදීන් හට පසුව ආපසු ලබාගත හැකි දීමනාවක් ස්වරූපයෙන් ගෙවීම් කිරීමට සලකා බලන්න.




- බලපෑමට ලක් වූ කුඩා ව්‍යාපාරවලට උපකාර කිරීමේ පැකේජවලට නිදහස් ජනමාධ්‍යවේදීන් ද ඇතුළත් කිරීම වෙනුවෙන් ද ජනමාධ්‍ය සංවිධාන පෙනී සිටිය යුතු ය.

International Federation of Journalists

IFJ Headquarters
IPC-Residence Palace, Bloc C
Rue de la Loi 155
B-1040 Brussels
BELGIUM
Telephone: +32 (0)2 235 22 00
Telefax: +32 (0)2 235 22 19
E-Mail: ifj@ifj.org

FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
අංක 96 බර්නාඩ් සොයිසා මාවත, කොළඹ 05
කාර්යාලය: 011 288 3483
ඊ-මේල්: fmmsrilanka@gmail.com
වෙබ් අඩවි: www.fmmsrilanka.lk
මාධ්‍ය ප්‍රතිසංස්කරණ සාහිත්‍ය එකතුව: www.mediareform.lk